සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| පළමු වාර පරීක්ෂණය 2018 | 08 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை | தரம் 08 |
| First Term Test 2018 | Grade 08 |

| | | |
|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | I II | පැය දෙකයි |
| கல்வித | I II | இரண்டு மணித்தியாலம் |
| Citizenship Education | I II | Two hours |

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1-5 දක්වා නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පොදු සේවාවක් යනු,
    I. ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් සපයන සේවා
    II. මුදල් අයකර හෝ සහනදායි මිලට සපයන සේවා
    III. ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම අරමුණු කරගෙන පොදුවේ සපයන සේවා
    IV. ගුණාත්මක සංවර්ධනය සඳහා පවතින සේවා වේ.

02. ශ්‍රී ලංකාව මැලේරියාව දුරුකල රටක් බව ප්‍රකාශයට පත් කරන ලද්දේ,
    I. ලෝක සෞඛ්‍ය සංවිධානය
    II. යුනිසෙෆ් සංවිධානය
    III. එක්සත් ජාතීන්ගේ සංවිධානය
    IV. රතු කුරුස සංවිධානය

03. 'සතුට' යන චිත්තවේගය අනුව ඇතිවන ප්‍රතික්‍රියාවක් නොවන්නේ,
    I. බැණ වැදීම     II. සිනාසීම     III. නැටීම     Iv. උඩපැනීම

04. 'එකා සැමටත් - සැම එකාටත් ' යන ආදර්ශ පාඨය හා සම්බන්ධ ආයතනය වන්නේ,
    I. පොලීසිය     II. දුම්රිය දෙපාර්තමේන්තුව
    III. සමූපකාරය     Iv. ගුවන් හමුදාව

05. පවුල තුල දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයන් වන්නේ,
    I. ආදරය හා රැකවරණය නොඅඩුව ලැබීම.
    II. සාකච්ඡා මඟින් තීරණ වලට නොඑළඹීම.
    III. රණ්ඩු සරුවල් මඟින් ප්‍රශ්න විසඳ ගැනීම.
    IV. සමානාත්මතාවයෙන් කටයුතු නොකිරීම.

6-10 දක්වා ප්‍රශ්න වලට සුදුසු පිළිතුර වරහන් තුලින් තෝරා තිත් ඉර මත ලියන්න.

06. ...................................................................... ආයුර්වේද වෛද්‍ය ක්‍රමය යටතේ පවත්වාගෙන යන ආයතනයකි.

07. ...................................................................... සන්නිවේදන ආයතන වල වගකීමකි.

08. ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු සතු ගුණාංගයක් විය යුත්තේ, ......................................................................

09. නායකත්වයට අනුව කටයුතු කරන්නා, ......................................................................

10. ...................................................................... පරිසර සංරක්ෂණය සඳහා දායකත්වය ලබා දෙයි.

(සවන් දීම, අපක්ෂපාතීව තොරතුරු සැපයීම, ආයුර්වේද ශික්ෂණ රෝහල, දිස්ත්‍රික් මහ රෝහල, නායකයා, මධ්‍යම පරිසර අධිකාරිය, අනුගාමිකයා)

11 - 15 දක්වා වගන්ති හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුල යොදන්න.

11. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය දුරකථන සේවා සපයනු ලබයි ( )

12. වයස අවු. 14 දක්වා ළමුන් සඳහා අධ්‍යාපනය අනිවාර්‍යය කිරීම රජයේ පියවරකි ( )

13. ජනමාධ්‍ය මඟින් වර්තමාන සමාජයට කිසිදු හානියක් නොවේ ( )

14. ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණයක් ලෙස අන් අයගේ මනසට ගරු කිරීම දැක්විය හැක ( )

15. පොදු දේපල අයුතු ලෙස පරිහරණය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී නායකයකුගේ ලක්ෂණයකි ( )

A තීරයට ගැලපෙන පිලිතුරු B තීරයෙන් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 16. මන්ත්‍රීවරයා | (i) සිසු සැරිය |
| 17. ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය | (ii) සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා |
| 18. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය | (iii) බැංකු සේවා |
| 19. නිදහස් අධ්‍යාපනයේ පියා | (iv) ආතර් සී දියෙස් මහතා |
| 20. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භය කල සේවාවකි | (v) ඡන්ද දායකයන් |
| | (vi) ළමා අයිතිවාසිකම් |

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

01). i. පොදු සේවාවක් යනු කුමක්දැයි හඳුන්වන්න.
ii. පොදු සේවා වල අවශ්‍යතා 02 ක් සඳහන් කරන්න.
iii. සෞඛ්‍ය සේවය මගින් ඉටු කරන කාර්යයන් 02 ක් දක්වන්න.
iv. අධ්‍යාපන සේවය මගින් ඉටු කරන කාර්යයන් 02 ක් දක්වන්න.
v. පොලිස් ස්ථානයක කාර්ය මණ්ඩල නිළධාරීන් දෙදෙනකු නම් කරන්න.
vi. පවුල තුල දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 02 ක් ලියන්න.
vii. පාසල තුල දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 02 ක් ලියන්න.
viii. සමාජයට නායකයන් අවශ්‍ය වීමට හේතු 02 ක් ලියන්න.
ix. මනස සන්සුන් කිරීමේ අභ්‍යාස 02 ක් ලියන්න.
x. පොදු සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියකු ඉටු කල යුතු යුතුකම් 02 ක් ලියන්න. (ලකුණු 20)

02). i. ඔබ ප්‍රයෝජනයට ගන්නා පොදු සේවාවන් 02 ක් ලියන්න. (ලකුණු 02)
ii. පොදු සේවා මහජනතාව වෙත සපයන ආකාරය අනුව වර්ග 03 කි. (ලකුණු 03)
iii. පොදු සේවා ඔබේ ජීවිතය යහපත් කර ගැනීමට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

03). i. අධ්‍යාපනය ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 02 ක් ලියන්න. (ලකුණු 02)
ii. ඔබට අධ්‍යාපනය ලබාගත හැකි රජයේ ආයතන 03 ක් නම් කරන්න. (ලකුණු 03)
iii. අධ්‍යාපනය ලබා ගැනීම තුලින් රටට දැයට සේවය කල හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

04). i. මගී ප්‍රවාහන සේවා සපයන ආයතන 02 ක් නම් කරන්න. (ලකුණු 02)
ii. බස් ඩිපෝවක සේවා සැපයීමට දායක වන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)
iii. පොදු ප්‍රවාහන සේවා භාවිතය නිසා අත් වන වාසි විස්තර කරන්න (ලකුණු 05)

05). i. පවුල් වර්ග දෙක මොනවාද? (ලකුණු 02)
ii. පවුල තුලින් දරුවන්ට ලැබෙන යහපත් දෙවල් 03 ක් ලියන්න. (ලකුණු 03)
iii. පවුලේ සමගිය හා දියුණුව ඇති කිරීමට ඔබට දායක විය හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

06). i. ළමා අයිතිවාසිකම් යනු මොනවාද? (ලකුණු 02)
ii. මෙම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඇති ආයතන 03 ක් නම් කරන්න. (ලකුණු 03)
iii. ළමා අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා ඔබ විසින් ඉටුකල යුතු යුතුකම් පැහැදිලි කරන්න (ලකුණු 05)

07). i. ඔබට ඇති වන යහපත් චිත්තවේගයන් හා අයහපත් චිත්තවේගයන් ලියන්න. (ලකුණු 02)
ii. ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලියේ ලක්ෂණ 03 ක් ලියන්න. (ලකුණු 03)
iii. ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම සමාජයේ යහපතට හේතු වේ යන වාක්‍යයට අදාලව අර්ථවත් වගන්ති 05 ක් ලියන්න. (ලකුණු 05)